// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2047/25 – 2017 නොවැම්බර් 28 වැනි අඟහරුවාදා – 2017.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

3 වැනි වගන්තිය යටතේ නියමය

1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, මෙම නියෝගය මගින්

01. විශ්‍රාමලත් රජයේ නිලධාරියකු විසින් 2015.10.14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (xxxi) හෝ 2016.06.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 (xxxii) සහ එයට කරන ලද සංශෝධන අනුව නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා 2016.11.10 දිනැති අංක 1992/29 දරන ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය අදළ විය යුතු බවත්;

02. රජයේ නිලධාරියකු විසින් 2016.07.14 දිනැති වෙළෙඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2016 අනුව නිකුත්කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා 2016.11.10 දිනැති අංක 1992/29 දරන *ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය අදළ විය යුතු බවත්;*

03. රජයේ නිලධාරියකු විසින් 2016.10.31 දිනැති අංක 210 (III) දරන චක්‍රලේඛය සහ එයට කරන ලද සංශෝධන අනුව විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් උපයෝගී කරගෙන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කර ආනයනය කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා 2016.11.10 දිනැති අංක 1992/29 දරන ගැසට් නිවේදනයේ සහ එයට කරන ලද 2017.07.11 දිනැති අංක 2027/7 දරන සංශෝධිත ගැසට් නිවේදනයේ නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය අදළ විය යුතු බවත්;

1A – PG 03846 – 557 (2017/12)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

04. සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ 87.03 යටතේ වර්ගීකරණය කරන ලද එන්ජින් ධාරිතාවය ඝන සෙන්ටිමීටර 1300 ඉක්මවන එහෙත් ඝන සෙන්ටිමීටර 1500 නොඉක්මවන, 2017.11.09 දින හෝ ඊට පෙර ණයවර ලිපිය විවෘත කරන ලද සහ 2018.04.30 දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා රේගුවෙන් නිෂ්කාශනය කර ගන්නා ලද වාහනයක් සඳහා 2016.11.10 දිනැති අංක 1992/29 දරන *ගැසට් නිවේදනයේ* නිශ්චිතව සඳහන් ගෙවිය යුතු නිෂ්පාදන බදු අනුපාතය අදළ විය යුතු බවත්;

05. ඉහත 01 සිට 04 දක්වා වගන්ති මගින් විස්තර වන වාහන සඳහා 2017.11.09 දිනැති අංක 2044/32 දරන *ගැසට් නිවේදනයේ* නිශ්චිතව සඳහන් නිෂ්පාදන බදුඅනුපාතයන් අදළ නොවන බවත්;

06. 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ තුන්වන වගන්තිය යටතේ පනවන ලද 2017.11.15 දිනැති අංක 2045/32 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රකාශිත නියෝගය මෙයින් අවලංගු කරන බවත්;

ප්‍රකාශයට පත් කරමි.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
කොළඹ 01.
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

01 - 331

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.